ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 10 | විෂයය Subject: සිංහල භාෂාව හා සාහිත්‍ය III | කාලය Time: පැය 02 |

නම : ..........................................................................................................................................

වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.

1,2,3,4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i (අ) ජාතක කතා පොත ලිවීමට මූලාශ්‍රය වූ ග්‍රන්ථය කුමක් ද?

(ආ) ජාතක පොත සිංහලයට නැගීමට අනුග්‍රහය දැක්වූයේ කවරෙක් ද?

ii ''දේවයනි, මහත් වූ කොලහාල ශබ්දයෙක. අපි කුමක් බවත් නො දැනුම්හ''

(අ) මෙකී කොටස උපුටා ගත් පාඩම නම් කරන්න.

(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කරන රජතුමාගේ නම කුමක් ද?

iii (අ) ගුත්තිල කාව්‍යයෙහි ආරම්භක කවිය රචනා කර ඇති ගණය කුමක් ද?

(ආ) ගුත්තිල කාව්‍යයේ රචකයා නම් කරන්න.

iv (අ) ජාතක කතා මුල් කරගත් ගී කාව්‍ය ග්‍රන්ථ දෙකක් ලියන්න.

(ආ) උම්මග්ග ජාතකයෙහි සතර කන් මන්ත්‍රණය සිදුවන්නේ කවුරුන් අතර ද?

v (අ) ගුත්තිල මහ සිසී
සක් දෙව් බසින් සැතපී
මින් දිනමැයි දැපී
බමර තත පලමුවෙන් සිඳපී

(අ) ''සක් දෙව් බසින් සැතපී'' යන්නේ අර්ථය ලියන්න.

(ආ) මෙහි සඳහන් ගුත්තිල ඇඳුරුතුමා ජීවත් වූ නගරය කුමක් ද?

vi (අ) පරමත්ථ ජෝතිකාවේ පාඨයක අදහසට අනුව සිංහල ජන කවියේ ඉතිහාසය කවර යුගයක් දක්වා විහිදී තිබේ ද?

(ආ) විවේකය විනෝදයෙන් ගත කිරීමට ගැමියා කී කවි හැඳින්වෙන නම කුමක් ද?

vii (අ) දෙවියන් උදෙසා පුදපූජා පවත්වන විට ගායනා කළ කවි වර්ගයක් දක්වන්න.
(ආ) සිංහල ජනකවිය තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ලියන්න.

viii ''හොඳයි කරුණාව වෙලිච්ච කුඹුරට වැස්සක් වගෙයි කියනවා නේ''

(අ) මෙම පාඨය ඇතුළත් කෘතිය සිංහලයට අනුවර්තනය කළේ කවුරුන් ද?

(ආ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළේ කවුරුන් ද?

ix (අ) ''Village in the Jungle" නවකතාව රචනා වූයේ කවර වර්ෂයකදී ද?

(ආ) මෙම නවකතාව සඳහා පාදක වූ ප්‍රදේශය කුමක් ද?

x (අ) "The Monky" නම් කෘතියේ කතුවරයා කවුද?

(ආ) "Savage Sanctuary" නම් ග්‍රන්ථයේ සිංහල පරිවර්තන කෘතිය කුමක් ද?

( ල. 2 x 10 = 20 )

(2) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) ''රජ්ජුරුවෝ වනාහි රාජ මානයෙන් ද ඉසුරු මදයෙන් ද මත් වැ දණ්ඩකින් පහරන ලද සර්ප රාජයකු සේ කෝපයෙන් දිලිහී, ඒ මහෞෂධයා කුමක් කෙරෙදැ'යි කියා, එසේ ම අභිමානපුරස්සර වූ එක් සියයක් රජදරුවන් පිරිවරා වේරම්බ වාතයෙන් හැළලී ගිය මහා සාගරය සේ අටළොස් අක්ෂෞහිණියක් යුක්ත වැ නික්මුණාහ.....''

(අ) රජතුමා අටළොස් අක්ෂෞහිණියක් සේනාව රැගෙන පිටත් වූ අයුරු උපමා කොට ඇත්තේ කෙසේ ද?

(ආ) මෙකී රජතුමාගේ ඉස්මතු වී පෙනෙන චරිත ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.

(ii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

එමා සත්හු වෙණ නද අසමානය

සමා නො වෙති කොවුලෝ උපමානය

(අ) ..........................................................................................................................

(ආ) ..........................................................................................................................

(iii) අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා
අනුන් ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමන් නෙළුව පලා

(අ) කවියේ අවසන් පද්‍ය පාදයෙන් පවසන ප්‍රධාන උපදේශය කුමක් ද?

(ආ) කවියා ඉහත උපදේශයෙන් ව්‍යංග්‍යයෙන් ජීවිතයට දෙන උපදෙස කුමක් ද?

(iv) ''මට වඩා හොඳින් ඔය ගැන දන්න කෙනෙක් තවත් මෙහෙ නෑ''

(අ) මෙම ප්‍රකාශය හා සැබැඳි අවස්ථාව කුමක් ද?

(ආ) ''ඔය ගැන'' යනුවෙන් සඳහන් වන්නේ කුමක් ද?

(v) ''නානා වර්ණ ධ්වජ පඞ්ක්ති ඇති **<u>සෛන්ධවයන්</u>** යොදාන ලද සර්වාලංකාරයෙන් පිටැ බඳිනා ලද හියොවුරු ඇති වැ නැගෙන ලද **<u>ධනුර්ධරයන්</u>** විසින් උපලක්ෂිත වූ සේනා නමැති සමුද්‍රයෙන් නැංගා වූ මහ තල් මස් කැල සේ......''

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මෙහි දැක්වෙන සේනාව යුදයට සැරසී යන අයුරු කෙටියෙන් දක්වන්න.

( ල. 4 x 5 = 20 )

(3) අ) කේවට්ට බමුණාගේ චරිතයත්

ආ) මහෞෂධ පඬිතුමාගේ චරිතයත් උම්මග්ග ජාතකයේ නිරූපණය කර ඇති ආකාරය නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

**නැතහොත්**

අ) අවස්ථෝචිතව චරිත වෙනස් කිරීම.

ආ) සරල භාෂා භාවිතය

ගුත්තිල කාව්‍ය රසවත් කාව්‍යයක් වීමට හේතු වී ඇත. නිර්දිෂ්ට කවිවලින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න. ( ල. 15)

(4) අ) අධිෂ්ඨානශීලීභාවය

ආ) ස්වාමි භක්තිය බැද්දේ ගම නවකතාවේ පුංචි මැණිකාගේ චරිතය තුළ නිරූපණය කර ඇති ආකාරය නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

අ) සංයමයෙන් උපදේශාත්මක අදහස් ඉදිරිපත් කිරීමත්

ආ) පොදු ජන වහර යොදා ගැනීමත්

''හානා හීය පානා අඬහැරෙන් දැනේ'' ජන කවි පෙළ පාඨකයාගේ රුචිය වඩවයි. උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න. ( ල. 15 )

(5) බැද්දේගම හා එහි වැසියන් ක්‍රමයෙන් ආභාවයට පත්වන අයුරු චිත්තරූප මැවෙන අයුරින් විවරණය කිරීමට බැද්දේගම කතුවරයා සමත් වී ඇත. උදාහරණ 3 ක් දක්වමින් විමසන්න.

(6) ''වචන විනාශකාරී ලෙස භාවිතයෙ සමාජයට අහිතකර ය'' උම්මග්ග ජාතකයේ නිරිදිෂ්ට කොටස ඇසුරින් උදාහරණ 3 ක් දක්වමින් පැහැදිලි කරන්න.

(7) වීණා වාදනයේ මිහිරිබව තීව්‍ර කොට දැක්වීමට ගුත්තිල කවියා රූස්වූවන්ගේ ප්‍රතිචාර යොදාගත් ආකාරය නිරිදිෂ්ට කොටසින් අදහස් උදානරණ 3 ක් වත් දක්වමින් විස්තර කරන්න. ( ල. 10 )